දුරකථන
Telephone
தொலைபேசி
011-2441147

ෆැක්ස්
Fax
தொலைநகல்
011-2325843

ඊ-මේල්
E-mail
மின் அஞ்சல்
sdig.wp@police.lk

මගේ අංකය
My No.
எனது எண்
S/DIG/WP/OUT/ 2-14-00/2021

ඔබේ අංකය
Your No.
உமது எண்

දිනය
Date
2021.11.05

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය - බස්නාහිර පළාත
Office of the Senior Deputy Inspector General of Police - Western Province

සභාපති
ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය
අංක 35
මේඩ්ලන්ඩ් පෙදෙස
කොළඹ 07.

<u>ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මගින් පිරිනැමීමට යෝජනා කර ඇති විශේෂඥ ආරක්ෂක උපදේශක තනතුර සම්බන්ධව.</u>

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ විශේෂඥ ආරක්ෂක උපදේශක තනතුරක් සඳහා 2021.08.16 දින සිට 2023.08.15 දින දක්වා වසර 02 ක කාලයක් සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ටී.එම්.ඩබ්.ඩී තෙන්නකෝන් වන මා පත් කිරීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය තීරණය කර ඇති බවට දන්වමින් 2021.08.07 දාතමින් යුතුව මා වෙත එවා ඇති ලිපිය හා බැඳේ.

ආයතන සංග්‍රහයේ XXX වැනි පරිච්ඡේදයේ සඳහන් පරිදි රජයේ නිළධාරීන් තම නිත්‍ය රැකියාවට හෝ ධුරයට පරිහාහිරව මේ ආකාරයේ වෙනත් සේවාවක් ඉටු කරන්නේනම් ඒ සඳහා විෂයභාර ලේකම් වරයාගේ පූර්ණ අනුමැතිය ලබා ගත යුතු බව සඳහන්ව ඇත. ඒ අනුව මෙවන් තනතුරක් භාරගැනීම සඳහා ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන ප්‍රකාරව මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙතින් අනුමැතියක් ලැබී නොමැති බැවින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මගින් පිරිනැමීමට අපේක්ෂිත උක්ත තනතුර භාරනොගන්නා බව මෙයින් ඔබ වෙත කාරුණිකව දන්වා සිටිමි.

කෙසේ වෙතත් පසුගිය කාලසීමාව තුල බස්නාහිර පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වශයෙන් මා විසින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙත ලබාදුන් සහාය ඉදිරියටද ඇවැසි අවස්ථාවන්හිදී ලබාදීමට කටයුතු කරන බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

ටී.එම්.ඩබ්.ඩී.තෙන්නකෝන්
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති
බස්නාහිර පළාත.

ටී.ඩබ්.ඩී. තෙන්නකෝන්
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති
බස්නාහිර පළාත
පොලිස් මූලස්ථානය

පිටපත් :- ගොණුවට